# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය
# නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර – 2022

## පරිසර නීතිය

## (පැය තුනයි)

මුළු ප්‍රශ්න ගණන: 06

ප්‍රශ්න <u>තුනකට(03)</u> පමණක් පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ)

---

1. පරිසර නීතියේ සංකල්ප සහ මූලධර්ම අන්තර්ජාතික තලයේදී ඉහල පැසසුමට ලක් වුවත්, දේශීය පරාමිතීන් තුළදී ඒවා පිළිගෙන ඇත්තේ කලාතුරකිනි. එහි ප්‍රතිඵලයක් ලෙස, ලෝකයේ බොහෝ ජාතික නීති පද්ධති තුළ අන්තර්ජාතික පාරිසරික නීතියේ සංකල්ප හා මූලධර්ම වල මූලික අභිමතාර්ථ සතුටුදායක ලෙස සපුරා නොමැත.

   තෝරාගත් පාරිසරික නීති සංකල්ප හා මූලධර්ම තුනක් ආශ්‍රයෙන් උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

   (ලකුණු 100)

2. ප්‍රශ්න <u>දෙකටම</u> පිළිතුරු සපයන්න.

   (අ) සංවර්ධන න්‍යාය පත්‍රයන් වලට පාරිසරික සලකා බැලීම් ඒකාබද්ධ කිරීමේ ප්‍රායෝගික හා සුදුසු ක්‍රමයක් ලෙස පාරිසරික තක්සේරු වාර්තාව සැලකේ. කෙසේ වුවත් හේතු ගණනාවක් කරණ කොටගෙන ශ්‍රී ලංකාවේ මෑත කාලීනව ආරම්භ කරන ලද බොහෝ සංවර්ධන ව්‍යාපෘති වල මෙම තත්වය දක්නට නොලැබේ.

   උක්ත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන, අන්තර්ජාතික ලේඛන හා නඩු තීරණ නීතිය ආශ්‍රයෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

   (ආ) සුප්‍රසිද්ධ ව්‍යාපාරික කාන්තාවක වන රූපාලි මහත්මිය, ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ තරු පහේ හෝටලයක් ඉදිකිරීමට සැලසුම් කරයි. ඇය ආයෝජකයන් කණ්ඩායමක් සමඟ එක්ව,

එම පළාතේම යෝජිත හෝටල් පරිශ්‍රය තුළ සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. කෙසේ වුවත්, මේ සඳහා හඳුනාගෙන ඇති ඉඩම ධීවර ගම්මානයකට යාබදව පිහිටා ඇත. එමෙන්ම, ඔවුන්ගේ ජීවන රටා සහ රැකියා කටයුතුවලට එය සෘණාත්මකව බලපෑම් ඇති කරන නිසා මේ ව්‍යාපෘතිය සම්බන්ධව ඔවුන් දැනටමත් කනස්සල්ල ප්‍රකාශයට පත් කර ඇත. මෙයට හේතු වී ඇත්තේ, යෝජිත ව්‍යාපෘතිය මගින් ඔවුන් විසින් සිය ජීවන උපායන් සඳහා භාවිතා කරන ලද භූමියෙන් සැලකිය යුතු කොටසක් ව්‍යාපෘතිය සඳහා යොදාගැනීමට බලාපොරොත්තු වීමයි. මෙම ප්‍රදේශයෙහි වාසය කරන එම පදිංචිකරුවන්ගේ විරෝධතා නොසලකා සිය සැලසුම් ඉදිරියට ගෙන යාමට රූපාලි මහත්මිය බලාපොරොත්තු වේ. ඔබ රූපාලි මහත්මියගේ නීතිඥවරයා වේ. ඇය ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති අනුමත කිරීමේ කාර්යය පටිපාටිය පිළිබඳව ඔබේ උපදෙස් බලාපොරොත්තු වේ.

රූපාලි මහත්මියට උපදෙස් දෙන්න.

(ලකුණු 40+60=100)

3. ABC (පුද්ගලික) සමාගම, පුත්තලම් දිස්ත්‍රික්කයේ ආකර්ෂණීය ගමක් වන "වනාතවිල්ලු" හි පිහිටා ඇති රසායන සමාගමකි. නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීමේ අරමුණින්, සමාගම ඉන්දියාවෙන් නව යන්ත්‍රයක් ආනයනය කරයි. ඉන්පසු, ඔවුන් එම යන්ත්‍රය සතියේ දිනවල උදෑසන සිට රාත්‍රිය දක්වා ප්‍රදේශවාසීන්ට දරාගත නොහැකි ඝෝෂාවක් නිකුත් කරමින් ක්‍රියාත්මක කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, කුඩා දරුවන් සහ වැඩිහිටියන් ඇතුළු බොහෝ පුද්ගලයන් ශ්‍රවණාබාධ වලින් පීඩාවට පත්ව ඇත. සමාගම විසින් ඔවුන්ගේ ද්‍රව අපද්‍රව්‍ය, අසල පදිංචි පුද්ගලයන් විසින් ඔවුන්ගේ වගා කටයුතු ඇතුළු දෛනික අවශ්‍යතා සඳහා යොදාගත් "කලා ඔයට" සෘජුවම බැහැර කරයි. ඒ අතරම, සමාගමේ විශාල චිම්නි වලින් පිටවන වායු (ගෑස්) සෘජුවම වායුගෝලයට නිරාවරණය වන අතර එමගින් වනාතවිල්ලු හි ජනතාවට බොහෝ චර්ම හා ශ්වසන රෝග ඇති ව තිබේ.

ඔබ පුත්තලම් ප්‍රදේශයේ රාජ්‍ය නොවන ආයතනයක සේවය කරන පරිසරවේදියෙක් යැයි උපකල්පනය කරන්න. ABC (පෞද්ගලික) සමාගමට විරුද්ධව ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

(ලකුණු 100)

4. මිනිස් වර්ගයාගේ අයිතිවාසිකම් සහතික කිරීමේ අවස්ථා සොයන ඕනෑම අයෙකුගේ අවසාන බලාපොරොත්තුව අධිකරණය බව අවිවාදාත්මක වේ. ස්වභාව ධර්මයේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින කිසිවකු සඳහාද මෙය ව්‍යතිරේකයක් නොවේ. බොහෝ අවස්ථාවල දී අධිකරණය ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සිය අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයේ මූලික අභිලාෂයන් සමග වර්ණ ගැන්වීම තුළින් ස්වභාව ධර්මයේ අයිතිවාසිකම් හඳුනාගැනීම උදෙසා අමතර දුරක් ගොස් ඇත.

විවිධ අධිකරණ පද්ධතීන් හි අධිකරණයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුල ස්වභාවධර්මයේ අයිතිවාසිකම් සහතික කර ඇති ආකාරය පිළිබඳ අදාළ උදාහරණ ඇසුරින් උක්ත ප්‍රකාශය සාකච්ඡා කරන්න. එකී කාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තත්වය අගයමින්, එම තත්ත්වය තවදුරටත් දියුණු කිරීමට අදාළ යෝජනා නිර්දේශ කරන්න.

(ලකුණු 100)

5. පාරිසරික ගැටලු හඳුනාගෙන පහත සඳහන් අවස්ථා වලදී ඒ සඳහා ලබාගත හැකි ප්‍රතිකර්ම සාකච්ඡා කරන්න. ඔබ දේශීය නීති සහ ප්‍රතිපත්ති සලකා බැලිය යුතු අතර, අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව ගත හැකි යෝජනා ඉදිරිපත් කළ යුතුය.

අ. "තණමල්විල" යාල වනාන්තරයට ආසන්නයේ ඇත. යාල යනු විවිධ ජීවී සහ අජීවී සම්පත් වලින් සමන්විත ජාතික උරුමයකි. තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සීමිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යාල වනාන්තරයට ඇතුළු වීමට අවසර ඇත. කෙසේ වුවත්, තණමල්විලින් පැමිණි එක්තරා පුද්ගල කණ්ඩායමක් ආහාර සඳහා හා අපනයනය කිරීම සඳහා නීතිවිරෝධීව මුවන්, මොණරුන් හා වලසුන් වැනි සතුන් දඩයම් කරයි. මේ අතර, වනාන්තරය ආසන්න අසල්වාසී ප්‍රදේශයේ පදිංචිකරුවන් දිවා හා රාත්‍රී කාලයන්හිදී අලින්ගේ පැමිණීමෙන් සිදුවන අඛණ්ඩ තර්ජනයන් අත්දකී. සමහරක් අලි පදිංචිකරුවන්ට පහර දෙන අතර ඔවුන්ගේ වගාවන් හා නිවාස විනාශ කරයි.

ආ. "කිරින්ද" යනු හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති නේත්‍රා ආකර්ෂණීය වෙරළ තීරයකි. මෙම වෙරළේ කොටසක් "තෙත්බිමක්" ලෙස අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කර ඇත. මෙම ප්‍රදේශය කැස්බෑවන්, සර්පයන් සහ කකුළුවන් ඇතුළු විශේෂ රැසක් සඳහා වාසස්ථානයකි. මෑතක දී මෙම ප්‍රදේශයේ හෝටලයක් ඉදි කිරීම සඳහා ජපන් සමාගමක් ශ්‍රී ලංකා රජය සමඟ ගිවිසුමක් අත්සන් කළේය. ඒ අනුව ඔවුන් තම ව්‍යාපෘතියේ අරමුණු

සම්පූර්ණ කරගැනීම සඳහා තෙත්බිම් කලාපයේ සීමාවන් නිර්ණය කරන ලදී. මෙය, මෙම ප්‍රදේශය වාසස්ථාන කරගෙන සිටින විශේෂ සඳහා සෘණාත්මක ලෙස බලපෑම් ඇති කරන ලදී. මීට අමතරව, අධික රළ පහර හේතුවෙන් කිරින්ද ස්වභාවික වෙරළ උද්‍යානයට හානි සිදුව ඇත. වෙරළබඩ ප්‍රදේශයට සිදුවී ඇති හානිය මෙම ගැටළුවට බොහෝ සෙයින් බලපා ඇති බව විශේෂඥයන් හඳුනාගෙන ඇත. අවසාන වශයෙන්, මෙම ස්ථානය මිනිසුන්ගේ විනෝදාස්වාදයට හා පදිංචියට අනාරක්ෂිත ස්ථානයක් බවට දැන් පත් වී ඇත.

(ලකුණු 50 x 2=100)

6. දකුණු ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින රටක් වන සන්ලන්ඩ්, කොවිඩ් 19 ආසාදිත ව වාර්තා වූ රෝගීන් සංඛ්‍යාවේ අඩුවීමක් පවතින බැවින්, මෑතක දී මුහුණු ආවරණ සම්බන්ධ රෙගුලාසි වෙනස් කරන ලදී. මුහුණු ආවරණ භාවිතය සම්බන්ධ රීතින් සංශෝධනය හේතුවෙන් බහුතරයක් පුද්ගලයන් මුහුණු ආවරණ භාවිතය නැවතූ අතර භාවිතා කරන ලද මුහුණු ආවරණ නිසි සෞඛ්‍ය රෙගුලාසි අනුගමනය නොකර පරිසරයට බැහැර කරන ලදී. එය නාගරික ප්‍රදේශවල බරපතල පාරිසරික ගැටලු ගණනාවකට දායක වූ අතර අවසානයේ සන්ලන්ඩ් හි පිරිසිදු පරිසරයකට ඇති අයිතියට බලපානු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සන්ලන්ඩ් පහත ගැටලු වලට මුහුණ දෙයි:

- මුහුණු ආවරණ ඝන අපද්‍රව්‍යයක් ලෙස නාගරික ප්‍රදේශවල බරපතළ පරිසර දූෂණ තර්ජන ඇති කරයි.
- ඉවත් කරන ලද මුහුණු ආවරණ නිසා ඇතිවන ජල හා ජලාපවහන පද්ධති අවහිර වීම විවිධ බෝ වන රෝග පැතිරීමට හේතු වේ.
- සමුද්‍ර හා වෙරළබඩ ප්‍රදේශවල දූෂණය.

මුහුණු ආවරණය නිසා සිදුවන දූෂණය සන්ලන්ඩ් හි බරපතලම පාරිසරික තර්ජනය බවට පත්ව ඇති බැවින්, ප්‍රධාන පරිසරික අධිකාරිය මෙම කරුණ විසඳීමට කමිටුවක් පත් කිරීමට තීරණය කරයි.

ඔබ මෙම කමිටුවේ සාමාජිකයෙක් යැයි උපකල්පනය කරන්න. සන්ලන්ඩ් හි මුහුණු ආවරණ වලින් සිදුවන දූෂණය සම්බන්ධයෙන් නෛතික වාර්තාවක් සෑදීමට ඔබට උපදෙස් ලැබී ඇත. මෙම ගැටලුව මගහරවා ගැනීමට අවශ්‍ය නිර්දේශ යෝජනා කිරීම ඔබෙන් බලාපොරොත්තු වේ. සන්ලන්ඩ් හි නීතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන යැයි උපකල්පනය කරන්න.

(ලකුණු 100)